# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය ! Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 15
NUMBER 06

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

OCTOBER 2012 ඔක්තෝබර් (බු:ව: 2556 වප් මාසය) http://www.lankaviththi.org




*Photograph*: **Chonil Weerawansa** - *Sri Lanka*

උතු රන මුවග ඉපිලෙන සිතෙහි සෙනෙ හස
මතු වුණු නෙතග බැල්මකි හීය විදි ලෙස
සිතු විලි දිගේ යන කල යොවුන් විය දෙස
සතු ටකි දැක්ම නුඹ වැනි සොඳුරු මියු ලැස!

**The beaming face, a sign of bubbly romantic start**
**The slight glance, an arrow ready to pierce a heart**
**Reminiscing along the path of past youthful days**
**It's a pleasure to see you, a fetching elegant face !**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

*අද ලෝකයේ බොහෝ රටවල් දේශපාලන වශයෙන් අස්ථාවර තත්වයක පවතී. එම රටවල නායකයෝ තම ප්‍රශ්න විසඳාගන්නට නොයෙක් ක්‍රම සොයති. දහ අතේ කල්පනා කරති. ප්‍රශ්න විසඳන්නට යොදන පිළියම්ද මුලදී හරියයි පෙනුණද ටික දිනකින් ඒ පිළියම ම තවත් ප්‍රශ්නයක් බවට පෙරළේ. ප්‍රශ්න වැඩිවන තරමට දේශපාලන සතුරෝද මතුවෙති. ශ්‍රීලංකාවටද මේ තත්වය පොදුය. අප බොහෝ දෙනාගේ මව්බිම වන ශ්‍රීලංකාව ප්‍රශ්න නිරාකරණය කෙරුණු, වෙසෙන කාටත් සාමකාමී සහජීවනයෙන් නිදහසේ සිටින්නට හැකි දේශයක් බවට පත්වෙනු දැක්ම අපේ එකම අපේක්ෂාවයි. මේ පුවත්පතේ අප පළකරන සෑම ලිපියක්ම වචනයක්ම අකුරක්ම එය සාක්ෂාත් කරගනු සඳහා ලියැවෙන බව සලකන්න.*

# රට හදමු! දිවි නගමු!

**කීර්ති ජයසුන්දර විසිනි**

ලංකාවිත්ති ගියවර, එනම් සැප්තැම්බර් කලාපය මුළුමනින්ම වාගේ අප වෙන් කළේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ය. දැන් යළිත් අප ශ්‍රීලංකාව සහ එහි සංවර්ධන වැඩ පිළිවෙළ පිළිබඳව කතාබහ කරන්නට සිතුවෙමු. ජාත්‍යන්තර වශයෙන් ඉක්මනින් විසඳිය යුතු කාරණා ලෙස පෙනෙන දේවලින් පටන්ගෙන අනෙක් අංශයන් වෙත ද පාඨක අවධානය යොමුකිරීම මේ ලියන ලිපියේ අරමුණයි.

## ශ්‍රීලංකා විදේශ ඇමති එක්සත් ජාතීන්ගේ මහා සමුළුව ඇමතීම

දැනට සති දෙකකට පෙර ශ්‍රීලංකා විදේශ ඇමති මහාචාර්ය ජී ඇල් පීරිස් මහතා එක්සත් ජාතීන්ගේ මහ සමුළුවේ 67 වන සැසි වාරය අමතමින් කළ කතාව වටිනා එකකි. එසේම සැප්තැම්බර් මස ටෙහෙරාන් හි පැවති නොබැදි ජාතීන්ගේ සමුළුවේදී ද ඔහු බටහිර රටවල් ජාත්‍යන්තර ප්‍රශ්න වලදී දක්වන උද්දච්ච අහිතකර ආකල්ප කෙරෙහි ශ්‍රීලංකාව ඇතුළුව සියළු නොබැදි රටවල්වල ඇති අසතුට හා කලකිරීම මනාව පැහැදිලි කර ඇති බව ද අපි ඇසුවෙමු.

මහාචාර්ය පීරිස් මහතා එක්සත් ජාතීන්ගේ සමුළුවේදී වඩාත් පැහැදිලි කර පෙන්නුම් කළේ මැතකදී වඩාත් කැපීපෙනෙන ලෙස බටහිර රාජ්‍යයන් විසින් ලොව අනෙක් රාජ්‍යයන්හි අභ්‍යන්තර කටයුතු කෙරෙහි හිතුවක්කාර සහ සාහසික ලෙස කරනු ලබන ඇඟිලි ගැසීම් සහ ගනු ලබන තීරණ කෙරෙහි ශ්‍රීලංකාවේ දැඩි අප්‍රසාදයයි. අනෙක් රාජ්‍යයන් ගැන ගන්නා තීරණවලදී ඒ රාජ්‍යයන්හි ස්වෛරීභාවය සහ ඒ රටවලට ආවේණික ප්‍රතිපත්ති සැලකිල්ලට ගනිමින් ඒවා නොබිඳෙන සේ බටහිර රාජ්‍යයන් කටයුතු කළ යුතුයයි ද මහාචාර්ය පීරිස් එහි දී අවධාරණයෙන් කියා සිටියේ ය.

ප්‍රශ්න විසඳන නියායෙන් මැතකදී බටහිර රාජ්‍යයන් යම් යම් රටවලට අත පොවමින් ගත් ක්‍රියා මාර්ග ඒ රටවල සමාජයන්හි කාලාන්තරයක් තිස්සේ පවතින ඔවුන්ගේ සංස්කෘතික උරුමයන්ට හානිකර ඒවා වූ අතර එසේ කිරීම ඒ රටක දේශීය උරුමයන් ආරක්ෂා කළයුතු බවට එක්සත්ජාතීන්ගේ සම්මුතියෙහි ම පනවා ඇති වගන්ති උල්ලංඝණය කිරීමක්ද වන බව පීරිස් මහතා පැහැදිලි කළේ ය.

## බටහිර උපක්‍රම

බටහිර රාජ්‍යයන් දැන් කඩා වැටෙමින් පවතින ඔවුන්ගේ දුර්වල ආර්ථික තත්වයන් යළි ගොඩනගා ගන්නට මානබලන්නේ දැන් දියුණු වෙමින් පවතින ආසියාකරයේ අනෙක් රටවල ආර්ථිකයන්ට හිතුවක්කාර හා අනිසි අන්දමින් බලපෑම් ඇතිකර එයට හානි කිරීමෙන් බව ලෝකයාට හොඳින්ම පැහැදිලිවී ඇතැයිද, ඒ ක්‍රියා පටිපාටිය වහා නැවැත්විය යුතුව ඇතැයි ද මහාචාර්ය පීරිස් අවධාරණාත්මක ලෙස පැවසී ය.

## දක්ෂිණ සබඳතා

එසේම දක්ෂිණ ලෝකයේ, එනම් ලතින් ඇමරිකානු සහ අප්‍රිකා මහාද්වීපයේ රටවල් එකමුතුවීමේ වැදගත්කම ද පෙන්වා දුන් පීරිස් මහතා ශ්‍රීලංකාව මින් පෙරට වඩා ඒ රටවල් හා මිත්‍රශීලී තානාපති සබඳතා මෑත කාලයේ සිට ගොඩ නගාගෙන අන්‍යෝන්‍ය ලෙස සුහදව කටයුතු කරන බවද, එය ඉදිරියේදී ශ්‍රීලංකාවේ යහපතට වඩාත් හේතු වන බවද ප්‍රකාශ කළේය. ඔහුගේ මෙම ප්‍රකාශනයන් ශ්‍රීලංකාව අද ජාත්‍යන්තර වශයෙන් පැමිණ සිටින වැදගත් සහ ශුභවාදී ස්ථාවරය මනාව පෙන්නුම් කරන්නකි.

## ගෝලීය චතුර්වාර්ෂික විමර්ශණය (Universal Periodic Review) UPR

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලය මගින් වසර හතරකට වරක් සිරිත් ලෙස කරනු ලබන එක්සත් ජාතීන්ට අයත් සියළු රටවල මානව හිමිකම් සුරැකීම් පිළිබඳ විමසා බැලීම මෙවර මේ නොවැම්බර් මාසයේදී සිදුකරන්නට නියමිත ය. ශ්‍රීලංකාව පිළිබඳ අවසන් වරට ඔවුන් සොයාබැලුවේ දැනට වසර හතරකට පෙර එනම් 2008 දී ය. ඒ කාලය ශ්‍රීලංකාවේ ඉතා තදින් ඊළම් යුද්ධය පවතින වකවානුවයි. එදා අපට එරෙහිව ගෙනැවිත් තිබුණු බොහෝ චෝදනා ගොනුකරන ලද්දේ අප රටට සතුරු, එමෙන්ම කොටින්ට හිතවත්, සහ උන්ට උදව්කළ එල්ටීටීඊ ගැති එන්ජීඕ කාරයින්ද, ඒ සඳහාම පිහිටුවාගෙන සිටි ව්‍යාජ, කූට මානව හිමිකම් සංවිධාන ද ඒකාබද්ධ වූ කණ්ඩායමක් මගිනි.

එහෙත් තවමත් කොටියාගේ ඉතුරු වුණු නැට්ට දැන් කලින් මෙන් ප්‍රබලව නැති නමුත් තවමත් දුර්වල සේ වැනෙනවා දැකිය හැක.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ ශ්‍රීලංකාවේ ස්ථිර නියෝජිතයා ලෙස පත්කර සිටින තානාපති ආරියසිංහ මහතා ජිනීවාහි 63 වන සැසි වාරය අමතමින් යුද්ධයෙන් පසු ශ්‍රීලංකාව ගෙන ඇති



**Prof. G . L . Peiris**
**The Foreign Minister**
***විදේශ ඇමති පීරිස් මහතා***

යහපත් ඵලදායී ක්‍රියාමාර්ග සහ ඒවායින් ලැබ ඇති ප්‍රථිපල විස්තර කළ අතර ඒ සියල්ල කෙරෙහි අනෙක් රටවල් දක්වන උනන්දුහීන ඇල්මැරුණු ස්වභාවය කෙරෙහි සමුළුවේ අවධානය යොමු කළේය.

සිය කතාවේදී ඔහු යුද්ධය නිමාවී වසර තුනක් ගෙවුණු සුළු කාලය තුළදී ශ්‍රීලංකා රජය විසින් ගන්නා ලද ශුභවාදී පියවරවල් කීපයක් එකින් එක විස්තරාත්මකව දැක් වීය. ප්‍රධාන කර්තව්‍යයන් වූයේ

**1.** යුද්ධයෙන් අවතැන් වූවන් නැවත තම පුරුදු ස්ථානවල ආරක්ෂිත ලෙස පදිංචිකරවීම.
**2.** යුද්ධය පැවති ප්‍රදේශවල කොටි සංවිධානය විසින් වළලා තිබුණු බිම්බෝම්බ ඉවත්කිරීම.
**3.** අත්අඩංගුවට පත් තදබල එල්ටීටීඊ සාමාජිකයන් පුනරුත්ථාපනය කොට ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාවලින් තොර යහපත් පුරවැසියන් ලෙස සමාජයට හුරුකිරීම
**4.** අධි ආරක්ෂිත කලාප ලෙස නම්කර තිබූ ප්‍රදේශවලින් ඒ පණුවා තිබූ තහංචි ඉවත්කිරීම.
**5.** උතුරේ ආර්ථික සංවර්ධනය නංවමින් මේ වන විට එය රටේ ඉහළම තත්වය දක්වා ළඟාකරවීම, ආදිය ඉන් සමහරකි.

4 වන පිටුවට ➤——→




අප සැමගේ විශ්වාසය දිනූ

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3